# UNIVERSITY GRANTS COMMISSION

**ESTABLISHMENTS CIRCULAR LETTER NO.** 09/2011

No.20, Ward Place,
Colombo 07
19th April 2011

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**PAYMENT OF RESEARCH ALLOWANCE – BUDGET PROPOSALS ON 2011**

Your attention is invited to Establishments Circular Letter No. 03/2011 of 14.03.2011 on the above subject.

2. I send herewith a copy of Management Services Circular No. 45 of 07.04.2011 issued on Payment of Research Allowance as per the Budget Proposals -2011 for your information and compliance.

3. Therefore, Establishments Circular Letter No. 03/2011 of 14.03.2011 issued in adopting Management Services Circular No. 44 of 10.03.2011 is hereby withdrawn.

(Prof. Gamini Samaranayake)
Chairman

Cc:
1. Chairman's Office/UGC
2. Vice-Chairman/UGC
3. Members of the UGC
4. Secretary/UGC
5. Deans of Faculties
6. Registrars of Universities
7. Financial Controller/UGC
8. Bursars of Universities
9. Librarians/ SAL/AL of the Higher Educational Institutions/ Institutes
10. Deputy Registrars/ Snr. Asst. Registrars/ Asst. Registrars of Campus /Institutes
11. Deputy Bursars/Snr .Asst. Bursars/ Asst. Bursars of Campuses/ Institutes
12. Chief Internal Auditor/UGC
13. Govt. Audit Superintendents of Universities
14. Snr. Asst. Int. Auditors/ Asst. Int. Auditors of HEIs
15. Secretaries of Trade Unions
16. Auditor – General

File No: UGC/HR/6/1/37

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක :45

මගේ අංකය-ඩීඑම්එස්/ඊ/08/21
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
2011.04.07

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

## 2011 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම

ඉහත මැයෙන් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 44 හා 44(i) මෙයින් අවලංගු කරනු ලබන අතර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වනු ලැබේ.

02. රජය විසින් ප්‍රකාශිත 2011 අයවැය යෝජනා අනුව විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සහ රාජ්‍ය අංශයේ පර්යේෂණ කටයුතුවල නියුතු ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ට දීමනා රහිත මූලික වැටුපෙන් සියයට විසිපහක (25%) ක පර්යේෂණ දීමනාවක් (මෙම දීමනාවට විශ්‍රාම වැටුප් හෝ ව්‍යවස්ථාපිත දීමනා හිමිකම් නොමැත) පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව මාසිකව ලබාදිය හැකිය.

03. මෙම දීමනාව ලැබීමට සුදුසුකම් ඇති නිලධාරීන් ;

I. විශ්ව විද්‍යාලයන්හි ස්ථිර කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය හා ඉන් ඉහළ මට්ටමේ ආචාර්යවරුන්.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි සඳහන් නිර්වචනය අනුව ``ජ්‍යෙෂ්ඨ මට්ටමේ`` තනතුරක ස්ථිර කරන ලද රාජ්‍ය නිලධාරීන් හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි සඳහන් නිර්වචනය අනුව ``අධ්‍යයන හා පර්යේෂණ සේවා`` හෝ ඉන් ඉහළ මට්ටමේ තනතුරක ස්ථිර කරන ලද රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්.

04. ක්‍රමවේදය

(අ) ඉහත 03 ඡේදය යටතේ පර්යේෂණ දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන් විසින් පර්යේෂණයන්හි ස්වභාවය, පර්යේෂණ කාල රාමුව සහ ක්‍රමවේදය ඇතුළත් පර්යේෂණ යෝජනාවක් (Research Proposal) 05 වන ඡේදයෙහි සඳහන් පර්යේෂණ කළමනාකරණය සඳහා වන සභාවට/කමිටුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගැනීමෙන් පසු, 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පර්යේෂණ දීමනාව ලබාගත හැකිය. මෙම පර්යේෂණ යෝජනාවට අදාළ පර්යේෂණ වාර්තාව වසරක් තුළ පර්යේෂණ කළමනාකරණය සඳහා වන සභාවට / කමිටුවට ඉදිරිපත් කළ යුතුය. තවද, අදාළ විශ්ව විද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගෙන, විශ්ව විද්‍යාලවල ආචාර්යවරුන් විසින් 2011.01.01 දිනෙන් පසුව ආරම්භ කර 2011.02.28 දිනට පසුවත් කරගෙන යනු ලබන පර්යේෂණ ද මෙම පර්යේෂණ දීමනාව ලබාගැනීම සඳහා අදාළ කරගත හැක. එසේ වුවද 2011.02.28 දින වන විට අවසන් කර ඇති පර්යේෂණ සඳහා මෙම පර්යේෂණ දීමනාව ලබා ගැනීම අදාළ කරගත නොහැක.

(ආ) වසර එකක කාලයක් අවසානයේදී එනම් 2011.12.31 දිනෙන් පසුව මෙම පර්යේෂණ දීමනාව තවදුරටත් ලබාදීම රඳා පවතිනුයේ, එම වසර තුළ අවසාන පර්යේෂණ වාර්තාව ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ හෝ 05 වන ඡේදයේ සඳහන් පර්යේෂණ කළමනාකරණය සඳහා වන සභාව / කමිටුව පිළිගත් විද්‍යාත්මක ප්‍රකාශනයක පළවීම හා/හෝ අදාළ දාර්ශනිකයන්ගේ සම්භාෂණය (Symposium) ට ඉදිරිපත් කිරීම පිළිබඳව සභාව/කමිටුව විසින් සෑහීමකට පත්වීම මතය.

05. පර්යේෂණ කළමනාකරණය

(අ) විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ පර්යේෂණ යෝජනා - අදාල විශ්ව විද්‍යාලයේ සභාපතිත්ව සභාව පිළිගත් පර්යේෂණ කමිටු

(ආ) රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව සේවය කරන නිලධාරීන්ගේ පර්යේෂණ යෝජනා - ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP)

(ඇ) අනෙකුත් ක්ෂේත්‍රයන්ට අදාල නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා - තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන පහත සඳහන් නිලධාරින්ගෙත් සමන්විත පර්යේෂණ අධීක්ෂණ කමිටුව විසින් හෝ අදාල පරිදි එම කමිටුව විසින් පත් කරනු ලබන අනු කමිටු

- ධාරා විජේතිලක මිය - ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
- වෛද්‍ය ඩී.ආර්.සී. රුබේරු මහතා - ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
- ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා - ලේකම්, පරිසර අමාත්‍යාංශය
- මාලනී පීරිස් මිය - ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- තිලක් කොල්ලුරේ මහතා - ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- ආචාර්ය සමන් කැලේගම මහතා - විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- බී.විජයරත්න මහතා - අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

06. අනෙකුත් කොන්දේසි

I. පර්යේෂණ සඳහා වන වියදම් ඒකාබද්ධ අරමුදලින් ආයතනවලට ලබාදෙන ප්‍රතිපාදන වලින් වැය නොකළ යුතුය. එහෙත් පර්යේෂණයේ ස්වභාවය අනුව, මූල්‍ය ආධාර අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ජාතික පර්යේෂණ කවුන්සලය වෙතින් ප්‍රතිපාදන ලබා දිය හැකිය.

II. පර්යේෂණ දීමනාව, වැය ශීර්ෂ අංක 1003 හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධයෙන් එනවිට ඒ ඒ ආයතනවල වැටුප් හා වේතන සඳහා වන වැය ශීර්ෂවලින් දැරිය යුතුය.

III. මෙම චක්‍රලේඛයෙන් අපේක්ෂිත පර්යේෂණ කටයුතු හේතුවෙන් නම නිත්‍ය රාජකාරීවලට බාධාවක් නොවිය යුතුය.

07. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, උසස් අධ්‍යාපන, කෘෂිකර්ම සහ තාක්ෂණ හා පර්යේෂණ යන අමාත්‍යාංශයන්හි එකඟතාවය මත නිකුත් කරන ලදී.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

<u>පිටපත් :-</u>
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
5. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
7. ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

(5–7:) සුදුසු පරිදි විශ්වවිද්‍යාල හා අදාළ ආයතන සඳහා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම මැනවි.

8. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය